කැලණිය විශ්වවිද්‍යාලය
මානවශාස්ත්‍ර පීඨය - වාග්විද්‍යා අංශය

# දෙමළ ඩිප්ලෝමා පාඨමාලාව

2021 වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම

ඉහත සඳහන් පාඨමාලාව සඳහා අපේක්ෂකයන් ලියාපදිංචි කිරීම පිණිස **2021.02.08** දින සිට **2021.03.08** දින තෙක් සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාරගැනීම සිදු කෙරේ.

දෙමළ භාෂාවේ කථා කිරීම, ලිවීම, අවබෝධය හා පරිවර්තනය කිරීම පිළිබඳ දැනුමක් ලබා එම බස භාවිත කිරීමට මෙන්ම දෙමළ සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට අපේක්ෂා කරන අය වෙනුවෙන් මෙම පාඨමාලාව විශේෂයෙන්ම සකස් කර ඇත. **2021 අප්‍රේල් මස පළමු සතියේ සිට දේශන ආරම්භ කිරීමට නියමිත ය.**

**පාඨමාලා කාලය** අධ්‍යයන වර්ෂ එකකි.

(සෙනසුරාදා සහ ඉරිදා දිනවල දේශන පැවැත්වෙන අතර මෙම දිනවලින් එක් දිනයක් පමණක් තෝරා ගත යුතුය. රටෙහි පවතින වසංගත තත්වය හේතුවෙන් දේශන අවස්ථානුකූලව මාර්ගගත ක්‍රමයට (online) සහ පන්තිකාමර දේශන වශයෙන් ද කැලණිය විශ්වවිද්‍යාලයේ දී අවස්ථානුකූලව පැවැත්වෙනු ඇත.)

**පාඨමාලා ගාස්තුව** රුපියල් 50,000කි. (රුපියල් පනස්දහසකි)
පාඨමාලා ගාස්තු වාරික දෙකකින් ගෙවිය හැකිය.
(පළමු වාරිකය රු. 30,000/- සහ දෙවන වාරිකය රු.20,000/-)

**අයදුම් කිරීම සඳහා අවම සුදුසුකම්** අ.පො.ස. (උසස්පෙළ) විභාගය විෂයයන් තුනකින් සමත්වීම

**අයදුම්පත්‍ර ගාස්තුව** "දෙමළ ඩිප්ලෝමා පාඨමාලාව - 2021 අයදුම්පත් ගාස්තුව" යනුවෙන් සඳහන් කොට කැලණිය විශ්වවිද්‍යාලයේ, අංක 055-1-001-1-0667549 දරන එකතු කිරීමේ ගිණුමට බැර වන පරිදි මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට රු.750.00ක් ගෙවා රිසිට් පත ලබා ගත යුතුය.

**අයදුම්පත්‍ර ලබාගන්නා ආකාරය**

https://hu.kln.ac.lk/depts/linguistics/media/attachments/2021/02/12/dip-in-tamil-application-2021.pdf යන වෙබ් ලිපිනයට පිවිස පාඨමාලා අයදුම්පත බාගත කරගත (download) හැකිය.

**නැතහොත්**

තැපැල මඟින් පාඨමාලා අයදුම්පත ඉල්ලුම් කරන්නේ නම්, ලියුම් කවරයේ වම් කෙළවරේ **"දෙමළ ඩිප්ලෝමා පාඨමාලාව 2021 අයදුම්පත් ලබාගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. මුදල් ගෙවූ අදාළ බැංකු රිසිට් පත ඉල්ලුම් කරන්නාගේ නම සහ ලිපිනය ලියන ලද රු. 15.00ක් වටිනා මුද්දර ඇළවූ "9 x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් 2021.03.02 දින හෝ ඊට පෙර **"සම්බන්ධීකාරක, දෙමළ ඩිප්ලෝමාව, වාග්විද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය"** යන ලිපිනයට එවීමෙන් ද පාඨමාලා අයදුම්පත ලබාගත හැකිය.

**අයදුම්පත්‍ර යොමු කරන ආකාරය** ඉහත කුමන ආකාරයකට හෝ ලබාගෙන සම්පූර්ණ කරන ලද අයදුම්පත්වල ස්කෑන් පිටපතක් (Scanned Copy) **2021.03.08** දින හෝ ඊට ප්‍රථම tamildiploma2021@gmail.com යන විද්‍යුත් ලිපිනයට එවිය යුතු අතර අයදුම්පතේ සහ බැංකු රිසිට්පතේ මුල් පිටපත් ඉහත ලිපිනයට ලියාපදිංචි තැපැල මඟින් එවීම අනිවාර්ය වේ. (බැංකු රිසිට් පත එවිය යුත්තේ වෙබ් පිටුවෙන් අයදුම්පත් ලබාගත් අයදුම්කරුවන් පමණි.) අයදුම්පත් එවීමේදී කවරයේ ඉහළ වම් කෙළවරේ "**දෙමළ ඩිප්ලෝමා පාඨමාලාව 2021**" යනුවෙන් සඳහන් කළ යුතුය.

බඳවා ගනු ලබන විද්‍යාර්ථීන් සංඛ්‍යාව සීමාසහිත බැවින් අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකිය.

අයදුම්පත් ලැබෙන අනුපිළිවෙළ මත ප්‍රමුඛතාව හිමි වේ.

පාඨමාලාව සම්බන්ධයෙන් වැඩි විස්තර පහත සඳහන් දුරකථන මඟින් ලබා ගත හැකිය.

දුරකථන අංක. 0112 908786/ 0112 908793

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
2021.02.07